*සැ. යු.*- 2022.07.15 දින පළ වූ අංක 2,289 දරන *ගැසට් පත්‍රයේ* I/II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,290 - 2022 ජූලි මස 22 වැනි සිකුරාදා - 2022.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 556 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අගෝස්තු මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

| | | |
|---|---|---|
| නඩු අංකය | : | DMB/396/2019 |
| පිස්කල් අංකය | : | 24/2022 |
| ස්වභාවය | : | උකස් බැඳුම්කර |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |
| වටිනාකම | : | රු. 8,753,243/- |

ප්‍රයිම් ෆයිනෑන්ස් පී.එල්.සී. (Prime Finance PLC) (මීට පෙර ඒෂියා කොමර්ස් ලිමිටඩ්) (Asia Commerce Limited), දිවස ෆයිනෑන්ස් ලිමිටඩ් (Divasa Finance Limited), ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් පී එල් සී (George Steuart Finance PLC) සහ සමිට් ෆයිනෑන්ස් පී. එල්. සී. (Summit Finance PLC) ලෙස හඳුන්වන ලද අංක 61, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08.

................*පැමිණිලිකරු.*

*එදිරිව*

(01) අඩප්පගොඩ සාලුක,
අංක 244/ඒ, මහා විහාර පාර,
මොල්ලිගොඩ,
වාද්දුව.

(02) ගමගේ නිශාන්ති,
අංක 244/ඒ, මහා විහාර පාර,
මොල්ලිගොඩ,
වාද්දුව.

......................*විත්තිකරුවන්.*

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 18 වැනි දින දරන කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව පැමිණිලිකරුට 1 සහ 2 වන විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට නියමිත රු. 8,753,243/- ක මුදලක් ද (මෙම මුදලින් දැනටමත් ගෙවා ඇති රු. 90,000/- ක මුදල අඩු විය යුතුයි) වර්ෂ 2019.06.25 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින තෙක් වාර්ෂිකව 23.39% ක් බැගින් රු. 8,753,243/- ක මුදලක් මත වැඩිදුර පොළිය ද ඉන් අනතුරුව සම්පූර්ණ මුදල ගෙවන තෙක් තීන්දු ප්‍රකාශයේ එකතු වූ මුදල මත නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඉහත සඳහන් 1 සහ 2 වන විත්තිකරුවන්ගේ නිවාස, ඉඩම්, බඩු මුට්ටු, අයවිය යුතු ණය හා බැරකම් තහනම් කිරීමෙන් හා අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබා ගත යුතු බවට දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත්වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසී බලපත්‍රයේ බලය පිට මා විසින් 2022.04.08 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල,

**වර්ෂ 2022ක් වූ අගෝස්තු මස 05 වැනි දින ප. ව. 2.00ට** ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ උපලේඛනයේ සඳහන් අංක 244/ඒ, මහාවිහාර පාර, මොල්ලිගොඩ, වාද්දුව දරණ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, වාද්දු වස්කඩු දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා බලසීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මොල්ලිගොඩ උතුර අංක 704/A ග්‍රාම නිලධාරී වසමේ, මොල්ලිගොඩ උතුර පිහිටි, එහි ඇති පස, ගහකොළ, වැවිලි සහ ගොඩනැගිලි, සහ සියලු දේද සමගින් වූ "ගොඩපොරගහවත්ත, ගොඩපොරගහවත්තේ පවුල, ඕච්චිකට්ටිය, ගොඩපොරගහවත්ත සහ ගොඩපොරගහවත්තේ කට්ටිය" යනුවෙන් හඳුන්වන, (බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර මහතා විසින් මැන සාදන ලද 2006.10.14 දිනැති අංක 5243 සැලැස්මේ ලොට් " A " දරන ඉඩම් කොටස අනුබෙදීමක් වන) ඉඩමට බලය ලත් මිනින්දෝරු අනුර ඉලන්කෝන් මහතා විසින් මැන සාදන ලද 390 දරන 2008.05.18 දිනැති පිඹුරේ නිරූපිත ලොට් අංක A 1 ලෙස ලකුණු කරන ලද බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එකී ලොට් A 1 ඉඩම් කැබැල්ලට මායිම් : උතුරට : අංක 13828 සැලැස්මේ ලොට් 9 ද, නැගෙනහිරට : අංක 13828 සැලැස්මේ ලොට් 9 සහ අංක 3147 සැලැස්මේ ලොට් B ද, දකුණට : ලොට් A2 ද, සහ බස්නාහිරට : ඇල ද, මායිම් වූ, එකී අංක 390 පිඹුරට අනුව එහි වපසරිය පර්චස් හතයි දශම අටක් (පර්: 07.8) විශාල ඉඩම වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍ර අංක D/ 317/17 යටතේ ලියා පදිංචි කර ඇත.

ඉහත කී ඉඩම එකී අංක 13828 සැළැස්මේ ලොට් අංක 9 ලෙස නිරූපිත ඉඩම් කැබැල්ල තුළින්, ඉහළින් සහ ඔස්සේ ඇති මාර්ග අයිතිය සහ අනෙකුත් පොදු මහජනයාගේ පාවිච්චිය සඳහා වන අඩි 12 ක් පළල ප්‍රධාන පාර තුළින්, උඩින්, යටින් හා ඔස්සේ ඇති ඉහලින් ඇති පොදු මාර්ග පරවශතා අයිතිය ද සමඟින් වේ.

*ගෙවීම් ක්‍රමය.-*

(1) වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් විකුණුම් මුදලෙන් 25% එම අවස්ථාවේදීම ගෙවිය යුතුය.
(2) ඉතිරි 75% ලිත් මසක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ මෙම නඩුවට අදාලව තැන්පත් කල යුතුය.
(3) රජයේ සහ වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

පී. ඩබ්ලිව්. සී. ඩී. පෙරේරා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්/සාම විනිසුරු,
දිසා අධිකරණය,
පානදුර.

වර්ෂ 2022 ක් වූ ජූනි මස 24 වැනි දින දී ය.

07-394

---

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඇස්කීසි අංක : 17/2022
නඩු අංකය : 3793/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 2,016,000/-
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

බ්‍රේසියා ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 244/2/ඒ,
තිඹිරිගස්කටුව, මීගමුව

.............................*පැමිණිලිකරු.*

*එදිරිව*

නරනාපිටි පතිරැන්නැහැලාගේ පැතුම් සංජීව,
අංක 143/බී, කෝවින්න, ආඬිඅම්බලම.

.................................*විත්තිකරු.*

ඉහත අංකය දරන නඩුවේ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 11 වැනි දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාරව විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගම වෙත අයකර ගන්නට කියා නියම කොට තීන්දු ප්‍රකාශය කරන ලද රුපියල් විසිලක්ෂ දසයදහක (රු. 20,16,000/-) ක මුදලක් සහ මුල් මුදල ගෙවන දින දක්වා මුල් මුදල මත විත්තිකරු එකඟවන ලද මසකට සියයට තුන (3%) බැගින් පොලිය ද, ඊට පැමිණිල්ලේ දිනයේ සිට නඩු තීන්දුව ප්‍රකාශ කරන දින දක්වා එම මුලු මුදල මත නෛතික පොලිය ද තීන්දු ප්‍රකාශයේ දින සිට සත්‍ය ලෙස එකී සම්පූර්ණ මුදල ගෙවන දින දක්වා නෛතික පොලිය ද වශයෙන් සම්පූර්ණ මුදල මේ දක්වා ඉහත නම සඳහන් විත්තිකරු විසින් ගෙවා නොමැති බැවින් මෙම නඩුවේ ඇස්කීසි ක්‍රියාවේ යෙදවීමේ බලපත්‍රයක් නිකුත් කර අධිකරණයෙන් නැවත වැඩිදුරටත් ආඥාවක් ලැබෙන තෙක් මෙයට යා කොට ඇති උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ යම් ලෙසකින් පැවරීම අන්සතු කිරීම හෝ වැය බරකට යටත් කිරීම ඒ සම්බන්ධයෙන් යම් ලේඛන ඉදිරිපත් කිරීම හෝ ලියාපදිංචි කිරීම හෝ උපදෙස් දීම එකී විත්තිකරු හට තහනම් කර එයින් වළක්වන ලද හෙයින් සහ එයින් හෝ ඉන් කොටසක් මුදලට හෝ ත්‍යාග වශයෙන් අන් ක්‍රමයකට ලබාගැනීම සියල්ලන්ට ම තහනම් කරන ලද හෙයින්,

**වර්ෂ 2022ක් වූ අගෝස්තු මස 19 වැනි දින ප. ව. 2.00ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට්* පත්‍රයේ ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75% ඉතිරි මුදල දින 30 ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැම්පත් කළ යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ, අලුත්කුරු කෝරළයේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ, කිඹුලාපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයට අයත්, කිඹුලාපිටිය ගමේ පිහිටි දවටගහවත්තේ කොටස සහ මල්වත්තහේන නම් වූ ඉඩමට එච්. ඒ. ආර්. පත්මසිරි බලයලත් මිනින්දෝරු විසින් මැන සාදන ලද අංක 1622 සහ 2016.10.22 දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : කෝදගොඩට අයිති ඉඩම ද, නැගෙනහිරට : ආර්. පී. රාජපක්ෂට අයිති ඉඩම ද, දකුණට : අඩි 10ක් පළල පාර ද, බස්නාහිරට : එච්ලින් පෙරේරාට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම සහ ඊට අයිති ගසකොළ, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 34/134 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*මාර්ග අයිතිය.-* එම්. ඩී. එඩ්වර්ඩ් බලයලත් මිනින්දෝරු විසින් මැන සාදන ලද අංක 1003ඒ සහ 1996.10.01 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් 53 සහ ලොට් අංක 51 දරන ඉඩම් කොටස්හි පොදු මාර්ග අයිතිය ද සමග වේ.

*දේපලට පිවිසීම.-* මීගමුව කිඹුලාපිටිය මාර්ගයේ කිඹුලාපිටිය පල්ලිය අසලින් ආඬිඅම්බලම දෙසට කි. මී. 1ක් ගිය පසු බුදු පිළිමය අසලින් වමට හැරී මී. 100ක් පමණ ගිය පසු ජල ටැංකිය පසු කර දකුණට ඇති මාර්ගයේ දකුණු පස පස්වන නිවස.

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මීගමුව.

වර්ෂ 2022ක් වූ ජූනි මස 08 වැනි දින දී ය.

07-584

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.